# PLAYHQ

## හි ලියාපදිංචි වන ආකාරය

CRICKET
AUSTRALIA

# PLAYHQ
# හි ලියාපදිංචි වන ආකාරය




මෙම උපකාරක මාර්ගෝපදේශය PlayHQ ලියාපදිංචි කිරීමේ සම්පූර්ණ ක්‍රියාවලිය ආවරණය කරයි.
මෙම පියවරෙන් පියවර මාර්ගෝපදේශය යෙහි ඇතුළත් වනනේ;

- PlayHQ ගිණුමක් නිර්මාණය කිරීම
- ක්‍රිකට් හැඳුනුම්පතක් නිර්මාණය කිරීම / ක්‍රිකට් හැඳුනුම්පතක් සම්බන්ධ කිරීම
- දරුවෙකු / යැපෙන්නෙකු ලියාපදිංචි කිරීම

## සැලකිය යුතු වැදගත් කරුණු :

- **'ක්‍රිකට් හැඳුනුම්පතක්' MyCricket ID එකකට සමාන නොවේ.** ක්‍රීඩකයෙකු ප්‍රථම වරට PlayHQ හරහා ලියාපදිංචි වූ විට ඔවුන්ට ඔවුන්ගේ PlayHQ ගිණුම ක්‍රිකට් හැඳුනුම්පතකට සම්බන්ධ කිරීමට අවශ්‍ය වනු ඇත. ක්‍රිකට් හැඳුනුම්පතක් යනු සෑම ක්‍රිකට් සම්බන්ධ කටයුත්තක් සඳහාම එක් පුද්ගලයෙකුගේ තනි ගිණුමකි. ඔබ ඔබේ සියලු මනාප කළමනාකරණය කරන ස්ථානය එය වන අතර, ක්‍රිකට් ක්‍රීඩකයෙක් විදියට, එය ඔබගේ සියලුම වෘත්තීය සංඛ්‍යාලේඛන ගබඩා කරන ගිණුමද වේ (MyCricket වේදිකාවෙන් එන ඒවා ඇතුළුව). අපි ඔබේ ක්‍රිකට් හැඳුනුම්පත හරහා ක්‍රීඩාවට ඔබේ සම්බන්ධය පිළිබඳ වැඩිදුර තොරතුරු ඉගෙන ගන්නා විට, එය ඔබට වඩාත් පෞද්ගලීකරණය කළ සහ අදාළ අත්දැකීම් ලබා දීමට අපට ඉඩ සලසයි.
- දරුවෙකු ලියාපදිංචි කරන්නේ නම්, **පළමුව ඔබේ PlayHQ ගිණුම නිර්මාණය කිරීමට මතක තබා ගන්න.** දරුවෙකු ලියාපදිංචි කිරීමේදී, කරුණාකර ඔබ ඔබේ ක්‍රිකට් හැඳුනුම්පත ඔවුන්ගේ PlayHQ ගිණුමට සම්බන්ධ කරන බවට වග බලා ගන්න.


**පහත උදාහරණය Cricket Blast Holiday වැඩසටහනට සහභාගිවන්නන් ලියාපදිංචි කිරීමකි, කෙසේ වෙතත් කනිෂ්ඨ සහ ජ්‍යෙෂ්ඨ ක්‍රිකට් ලියාපදිංචි කිරීම් සඳහා උපදෙස් බොහෝ දුරට සමාන වේ.**




CRICKET AUSTRALIA

# PLAYHQ
# හි ලියාපදිංචි වන ආකාරය

1. PlayCricket වෙබ් අඩවිය හරහා, ඔබේ ක්‍රීඩා සමාජය සොයාගෙන අදාළ නිෂ්පාදිතය යටතේ 'Register' ක්ලික් කරන්න.








සමාජ ක්‍රිකට් උදාහරණය


PlayCricket වෙබ් අඩවිය හරහා 'Register' එබීමෙන් පසු, ඔබව නැවත PlayHQ වෙත හරවා යවනු ලැබේ.

# PLAYHQ
# හි ලියාපදිංචි වන ආකාරය

ඔබ PlayHQ පිටුවේ නිෂ්පාදන විස්තර සමාලෝචනය කළ පසු, 'Get Started' -->' මත ක්ලික් කරන්න .





සමාජ ක්‍රිකට් උදාහරණය




වැඩසටහන් ලියාපදිංචි කිරීමේ උදාහරණය

# PLAYHQ
# හි ලියාපදිංචි වන ආකාරය

2. ඔබට දැනටමත් **PlayHQ** ගිණුමක් තිබේ නම්, පියවර 5 වෙත යන්න. ඔබට තවමත් ගිණුමක් නොමැති නම්, **'Create and account'** මත ක්ලික් කරන්න.





ඔබ ළමයෙකු ලියාපදිංචි කරන්නේ නම්, කරුණාකර ඔබගේම විස්තර සහිතව PlayHQ ගිණුමක් විවෘත කරන්න. එවිට ඔබට ඔබගේ PlayHQ ගිණුම යටතේ පවුලේ සාමාජිකයන් හෝ යැපෙන්නන් ලියාපදිංචි කළ හැක



# PLAYHQ
# හි ලියාපදිංචි වන ආකාරය

3. නව ගිණුමක් විවෘත කරන්නේ නම්, අවශ්‍ය පරිදි විස්තර සම්පූර්ණ කර 'Register' ඔබන්න.








CRICKET AUSTRALIA

# PLAYHQ
# හි ලියාපදිංචි වන ආකාරය

4. PlayHQ වෙත අලුතින් ලියාපදිංචි වන අය සඳහා, ඔබේ විද්‍යුත් තැපැලට සත්‍යාපන කේතයක් යවනු ලැබේ. ඔබට ඔබගේ විද්‍යුත් තැපැල් එන ලිපි හරහා සත්‍යාපන කේතය ලබා ගැනීමටත් PlayHQ අඩවියේ කේතය තහවුරු කිරීමටත් අවශ්‍ය වනු ඇත (ඔබට සත්‍යාපන කේතය සොයාගත නොහැකි නම් කරුණාකර ඔබගේ junk තැපැල පරීක්ෂා කරන්න).


ඇතුල් කළ පසු 'Confirm Code' ඔබන්න.




# PLAYHQ
# හි ලියාපදිංචි වන ආකාරය

5. දැන්, ඔබගේ ඊමේල් ලිපිනය සහ මුරපදය භාවිතයෙන් ඔබගේ PlayHQ ගිණුමට ඇතුල් වන්න.




# PLAYHQ
# හි ලියාපදිංචි වන ආකාරය

6. මෙම පියවරේදී, ඔබ ලියාපදිංචි කරන්නේ කවුරුන්ද යන්න තෝරා ගැනීමට අවශ්‍ය වනු ඇත.
**විකල්ප 1**– මා ලියාපදිංචි කිරීම
**විකල්ප 2** – නව පවුලේ සාමාජිකයෙකු හෝ යැපෙන්නෙකු ලියාපදිංචි කිරීම.





7. සහභාගිවන්නා ලියාපදිංචි වන භූමිකාව තෝරන්න. මෙම අවස්ථාවේදී, අපි දරුවෙකු/යැපෙන්නෙකු ක්‍රීඩකයෙකු ලෙස ලියාපදිංචි කරන්නෙමු.

පුහුණුකරුවන් සහ කණ්ඩායම් කළමනාකරුවන් ද සෑම වාරයක්ම PlayHQ හරහා ලියාපදිංචි විය යුතු බව මතක තබා ගැනීම වැදගත්ය. මෙම භූමිකාවන් අදාළ වන විට ලියාපදිංචි කිරීමේ පෝරමයේ මෙම කොටසේ දිස් වනු ඇත.




Program Registration





Club Cricket Registration

CRICKET AUSTRALIA

# PLAYHQ
# හි ලියාපදිංචි වන ආකාරය

8. සියලුම සහභාගිවන්නන්ගේ විස්තර සම්පූර්ණ කරන්න




ඔබ සියලුම සහභාගිවන්නන්ගේ විස්තර සම්පූර්ණ කළ පසු, 'Save and Continue' -->' ක්ලික් කරන්න.







CRICKET AUSTRALIA

# PLAYHQ
# හි ලියාපදිංචි වන ආකාරය

9. 'ගාස්තු' කොටස යටතේ නියමයන් සහ කොන්දේසි පිළිගැනීම සහතික කර ‘Continue’ -->' ක්ලික් කරන්න.





CRICKET AUSTRALIA


# PLAYHQ
# හි ලියාපදිංචි වන ආකාරය

10. මීළඟට ඔබේ Cricket ID එක ඔබේ PlayHQ ගිණුම සමඟ සම්බන්ධ කිරීම ය. ඔබ මාර්ගගතව හෝ MyCricket යෙදුම හරහා පවා කිසියම් පුහුණුවීම් හෝ විනිසුරු පාඨමාලා හදාරා ඇත්නම් ඔබ මීට පෙර ක්‍රිකට් හැඳුනුම්පතක් සාදා තිබිය හැක. ***'ක්‍රිකට් හැඳුනුම්පතක්' යනු 'MyCricket ID' නොවන බව කරුණාවෙන් සලකන්න.***

ආරම්භ කිරීමට, 'Link Cricket ID' බොත්තම ක්ලික් කරන්න.




**කරුණාකර සටහන් කර ගන්න:** අගෝස්තු 22 ට පෙර ලියාපදිංචි කිරීම් සඳහා, මෙම තිරයේ පිරිසැලසුම ටිකක් වෙනස් විය හැක.







CRICKET AUSTRALIA

# PLAYHQ
# හි ලියාපදිංචි වන ආකාරය

එවිට ඔබව ක්‍රිකට් හැඳුනුම්පත පිටුවට යොමු කරනු ඇත - ඔබට දැනටමත් ක්‍රිකට් හැඳුනුම්පතක් තිබේ නම්, ඔබගේ විද්‍යුත් තැපැල සහ මුරපදය භාවිතා කර ලොග් වන්න. එසේ නොවේ නම්,  'Sign Up' ඔබන්න.


ඔබට දැනට ක්‍රිකට් හැඳුනුම්පතක් තිබේදැයි ඔබට විශ්වාස නැතිනම්, 'අමතක වූ මුරපදය' සබැඳිය ක්ලික් කර ඔබේ ක්‍රිකට් හැඳුනුම්පත විය හැකි යැයි ඔබ විශ්වාස කරන විද්‍යුත් තැපැල් ලිපිනය ඇතුළත් කරන්න. පද්ධතිය මෙම විද්‍යුත් තැපැල් ලිපිනය හඳුනා ගන්නේ නම්, නව මුරපදයක් සෑදීම දිගටම කරගෙන ගොස් එම අලුතින් සාදන ලද මුරපදය සමඟ ඔබේ ක්‍රිකට් හැඳුනුම්පතට ලොග් වන්න.

***- පිටුව හිස් නම්, වෙනත් බ්‍රවුසරයක් භාවිතා කිරීමට උත්සාහ කරන්න (එනම් ; Microsoft Edge).***



# PLAYHQ
# හි ලියාපදිංචි වන ආකාරය


ඔබ Register' ක්ලික් කළහොත් සියලු විස්තර සම්පූ ර් ණ කර ‘Create Cricket ID’ ඔබන්න.







CRICKET AUSTRALIA

# PLAYHQ
# හි ලියාපදිංචි වන ආකාරය





11. දැන් ක්‍රිකට් හැඳුනුම්පතක් සාදා ඇති අය සඳහා, සත්‍යාපන කේතයක් ඔබේ විද්‍යුත් තැපෑලට යවනු ලැබේ. ඔබගේ ඊමේල් එන ලිපි හරහා සත්‍යාපන කේතය ලබාගෙන ක්‍රිකට් හැඳුනුම්පත පිටුවේ කේතය තහවුරු කරන්න (ඔබට සත්‍යාපන කේතය සොයාගත නොහැකි නම් කරුණාකර ඔබගේ junk තැපෑල පරීක්ෂා කරන්න).

ඇතුල් වූ පසු ‘Continue’ ඔබන්න.



# PLAYHQ
# හි ලියාපදිංචි වන ආකාරය


12. එවිට ඔබව PlayHQ අඩවිය වෙත නැවත යොමු කරනු ඇත. ඔබේ ක්‍රිකට් හැඳුනුම්පත 'සම්බන්ධිත' බව ඔබ දැකිය යුතුය - ’Continue’ -->' ඔබන්න.




**කරුණාකර සටහන් කර ගන්න:** අගෝස්තු '22 න් පසු ලියාපදිංචි කිරීම් සඳහා, මෙම තිරයේ පිරිසැලසුම ටිකක් වෙනස් විය හැක.

# PLAYHQ
# හි ලියාපදිංචි වන ආකාරය

13. අවසාන වශයෙන්, ඔබේ ගෙවීම් විස්තර සම්පූර්ණ කර ‘Continue Purchase’ ඔබන්න.




CRICKET AUSTRALIA